කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

# දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2021

2024 අගෝස්තු

## සමාජීය විද්‍යා පීඨය

## ජනසන්නිවේදනය

භාෂාව හා නිර්මාණාත්මක සන්නිවේදනය **MACO – 28214**

ප්‍රශ්න **පහකට** (05) පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

1. 'මානවයාගේ චින්තනය මෙන් ම සියලු සමාජීය ක්‍රියාදාමයන්හි පදනම ගොඩනැගෙන්නේ භාෂාව මගිනි.' නිර්වචන ඇසුරින් පැහැදිලි කරන්න.

2. 'නූතන ජනමාධ්‍ය සංදේශවල අන්තර්ගතය නිර්මාණශීලීව පෝෂණය කිරීම සඳහා ජනවහර දායක කරගෙන තිබේ.' රූපවාහිනී ටෙලිනාට්‍ය තේමා ගීත නිදසුන් වශයෙන් ගෙන පැහැදිලි කරන්න.

3. 'සමකාලීන සමාජ, ආර්ථික, සංස්කෘතික සංවාද ගොඩනැගීමෙහි ලා පුවත්පත් කතුවැකි දක්වන දායකත්වය සුවිශේෂී වේ.' තෝරාගත් කතුවැකි රචනා ඇසුරින් විවරණය කරන්න.

4. ජනමාධ්‍යයක් ලෙස ගුවන් විදුලියෙහි පවත්නා නිර්මාණාත්මක ලක්ෂණ සැකෙවින් පැහැදිලි කර, එම ලක්ෂණ ගුවන් විදුලි වැඩසටහන් තුළ භාවිත වන ආකාරය නිදසුන් ඇසුරෙන් විස්තර කරන්න.

5. කිසියම් අදහසක් නිර්මාණාත්මකව සන්නිවේදනය කිරීමෙහි ලා සාහිත්‍යකරුවන් භාෂාව උපයෝගී කරගෙන ඇති ආකාරය සම්භාව්‍ය සාහිත්‍ය නිර්මාණ ඇසුරින් විග්‍රහ කරන්න.

6. නිර්මාණයක් සිදුකිරීමේ දී අවශ්‍ය වන මූලිකාංග පිළිබඳ පැහැදිලි කර, නිර්මාණාත්මක රචනය තුළ, පෙළ සැකසීමේ දී අවධානය යොමු කළ යුතු අංග පිළිබඳ සාකච්ඡා කරන්න.

7. සිනමාව තුළ පරිගණකයෙන් නිර්මිත රූප (Computer Generated Imagery) තාක්ෂණයේ නිර්මාණශීලී භාවිතයන් පිළිබඳ නිදසුන් සහිතව විමසන්න.

8. පහත සඳහන් මාතෘකා අතුරින් **දෙකක් (02)** පිළිබඳ සටහන් ලියන්න.
   i. භාෂාව හා සංස්කෘතිය
   ii. කැමරා රූප කෝණ
   iii. උප භාෂා
   iv. ජනශ්‍රැතිය හා නිර්මාණාත්මක සන්නිවේදනය
   v. විනෝදාස්වාද කර්මාන්තයක් ලෙස සංගීත ක්ෂේත්‍රය
   vi. සමාජ ජාල මාධ්‍ය හා සමකාලීන භාෂා ප්‍රවණතා

***********************